ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. | 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல. | 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-AP/03/FI/12 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } | දිනය / திகதி / Date } 2026.03.23

## බස්නාහිර පළාත්
## ව්‍යාපාර චක්‍රලේඛ 03/2026

බස්නාහිර පළාතේ,
සියළුම ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සභාපතිවරුන් වෙත.

**කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් පරිවර්තන සිදු කිරීම**

මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද අංක : DMS/SAL/07 හා 2025.12.29 දිනැති, **"කළමනාකරන සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් පරිවර්තන සිදුකිරීම "** සම්බන්ධයෙන් වූ ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GOS/ADM/6/2/19-2026 හා 2026.03.16 දිනැති ලිපිය මඟින් ඉහත චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම 2026.02.26 දින සිට බස්නාහිර පළාතට අදාල කරගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් එම චක්‍රලේඛයන්හි සඳහන් විවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

කේ.ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා

පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත.

දුරකථන : 0112-093416
ෆැක්ස් : 0112-092636
විද්‍යුත් ලිපිනය : accpay@cs.wpc.gov.lk

පිටපත්: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: DMS/SAL/07
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.12. 29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

<u>**කළමනාකරන සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් පරිවර්තන සිදු කිරීම.**</u>

2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත පරිදි රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2025.03.25 දිනැතිව කළමනාකරන සේවා චක්‍රලේඛ 01/2025 නිකුත් කර ඇත.

02. ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතන එම චක්‍රලේඛ උපදෙස් අනුව වැටුප් පරිවර්තනය හා අදාළ දීමනා ගෙවීම සිදු කර ඇති ආකාරය පිළිබඳව අභ්‍යන්ත පරීක්ෂාවක් 2026.01.31 දිනට ප්‍රථම ඒ ඒ ආයතන අභ්‍යන්තර විගණක සම්බන්ධ කර ගනිමින් අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කර නිවැරදිව අදාළ පරිවර්තන සිදු කර ඇති බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලමි.

03. ඊට අදාළව පියවර ගැනීම පිළිබඳ තොරතුරු 2026.02.15 දිනට ප්‍රථම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමටද පියවර ගත යුතුය.

04. රජය සතු ව්‍යාපාර වල සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අදාලත්වය පිළිබඳව ඔබ වෙත යොමු කරන ලද මගේ අංක DMS/CAD/ALLOW හා 2025.10.03 දිනැති ලිපිය කෙරෙහිද ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

05. ඒ අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් ද ඇතුළත් සියලුම රාජ්‍ය අස්ථිත්වයන්ගේ සේවක සංඛ්‍යා කළමනාකරණය, වැටුප්, දීමනා හා වෙනත් ගෙවීම සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන්ට අදාලව ක්‍රියාකළ යුතුය.

06. එබැවින් සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් වල නිලධාරින්ගේ අතිකාල දීමනා ගණනය කිරීමේදී සාප්පු හා කාර්යාල පනතේ විධිවිධාන අදාල නොවන බවටත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි උපලේඛන I හි සඳහන් මාසික වැටුප 240න් බෙදා පැයකට හිමිවන අතිකාල දීමනාවේ අගය ගණනය කිරීම අනිවාර්ය වන බවටත් ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

ඒ.එන්.හපුගල
භාණ්ඩාගාරයේ ලේකම් (වැ.බ.) සහ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් (වැ.බ.)

පිටපත් : 1. විගණකාධිපති